දරුවන් උදෙසා
බයිබලයක්



# නායක පූජකවරු ජේසුස් වහන්සේ හමුවෙති

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus
Alastair Paterson

සකස්කරන්නා: M. Maillot; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජේසුස් වහන්සේ දේව මාළිගාවට ගිය දවසක,
මිනිසුන් දෙවියන් වහන්සේගේ ගෘහයට අගෞරව
කරන ආකාරය දුටු සේක. ඔවුහු දේවස්ථානය තුළම
සතුන් විකුණමින් මුදල් හුවමාරු කරමින් සිටියෝය.



ලණු වලින් කසයක් සාදාගත් උන්වහන්සේ වෙළදාම් කරමින් සිටි මිනිසුන්ව දේව මාලිගාවෙන් එළවා දැමූ සේක. “මේවා රැගෙන මෙතැනින් පිටවෙන්නයැ” යි උන්වහන්සේ අණ කළ සේක. “මාගේ පියාණන් ගේ ගෘහය වෙළදාම් පොළක් නොකරන්න” ජේසුස් වහන්සේ උන්වහන්සේගේ පියාණන්ගේ ගෘහයට ආදරය කළසේක.





එලෙස දේව
මාළිගාවෙන් මිනිසුන්
එළවා දමන්නට තරම්
උන්වහන්සේට ඇති
අයිතිය පැහැදිලි
කරන්නට ලකුණක්,
නායකයෝ ජේසුස්
වහන්සේගෙන් ඉල්ලා
සිටියෝය. “දේව මාළිගාව
විනාශ කරන්න, මම එය
දවස් තුනකින් නැවත ගොඩ
නගන්නෙමි” යි ජේසුස් වහන්සේ
පිළිතුරු දුන්සේක. එය කළ
නොහැකියි! ඒ දේව මාළිගාව
සාදන්නට අවුරුදු හතළිස්
හයක් ගත වී තිබුණි.

නමුත් ජේසුස් වහන්සේ පැවසුවේ
උන්වහන්සේගේම ශරීරය ගැනය.
දේව මාළිගාව සේම උන්වහන්සේගේ
ශරීරයද දෙවියන් වහන්සේගේ
වාසස්ථානය විය. කුරුසිය
මත මිය යන්නට නියමිතව
තිබුනත් දෙවියන් වහන්සේ
තුන් වන දිනදී උන්වහන්සේව
මරණයෙන් නැවත නැගිටවන
බව ජේසුස් වහන්සේ
දැන සිටිසේක.





එක් රාත්‍රියක
ආගමික
නායකයන්ගෙන්
කෙනෙක් ජේසුස්
වහන්සේ මුණ
ගැසෙන්නට ආවේය.
උන්වහන්සේ
සිදුකළ හාස්කම්
මඟින් ජේසුස්
වහන්සේ, දෙවියන්
වහන්සේ විසින් එවූ
කෙනෙකු බව ඔහු
දැන සිටියේය.



ජේසුස් වහන්සේ
නිකදේමුස්ට, මිනිසුන්
දේව රාජ්‍යයට ඇතුළු
වන්නට නම් ඔවුන්
නැවත ඉපදිය යුතු බව
පැවසූ සේක.
නිකදේමුස් එය තේරුම්
නොගත්තේය. වැඩුණු
මිනිසෙකු නැවත කුඩා
බිළිදෙකු වන්නේ
කෙසේද? ඊට අමතරව,
ඔහු ආගමානුකූල
කෙනෙකි. එය
ප්‍රමාණවත් මදිද?



“ආත්මයෙන් උපන්
දෙය ආත්මිකයි”
ජේසුස් වහන්සේ
පැහැදිලි කළසේක.
“දෙවියන් වහන්සේගේ
ආත්මය සුළඟ වැනිය.
මිනිසුන්ට සුළඟ
දකින්නවත් තේරුම්
ගන්නවත් නොහැකිය.
ඔවුන් දකින්නේ සුළඟ
කරන දේ පමණි”.



බොහෝ කලකට පෙර ඊශ්‍රායෙල් පුත්‍රයන් මෝසෙස් ට මැසිවිලි නැඟූ අයුරු ජේසුස් වහන්සේ නිකදේමුස් ට මතක් කර දුන්සේක. “අපට කෑම නැත, වතුර නැත, දෙවියන් වහන්සේ අපට දුන් රොටි වලට අප කැමති නැතැ” යි ඔවුහු කෑ ගැසුවෝය.

මිනිසුන්ගේ පාපය නිසා
දෙවියන් වහන්සේ කෝප වූ සේක.
උන්වහන්සේ ගිනිමය සර්පයන්
ඔවුන් වෙත එවූ සේක. සර්පයෝ
මිනිසුන්ට දෂ්ඨ කළෝය. මිනිස්සු
බොහෝ දෙනෙක් මිය ගියෝය.



“අපි පව් කළෙමු. සර්පයන්
ඉවත් කරන ලෙසට ස්වාමීන්
වහන්සේට යාච්ඤා කරන්න”යැයි
මිනිස්සු කන්නලව් කළහ. එනිසා
මෝසෙස් ඔවුන් වෙනුවෙන්
යාච්ඤා කළේය. නමුත් දෙවියන්
වහන්සේ සර්පයන් ඉවත්
නොකළ සේක.





දෙවියන් වහන්සේ ගිනිමය
සර්පයෙකු සාදා එය දණ්ඩක
සවි කරන ලෙස මෝසෙස්ට කී
සේක. “දෂ්ඨ කරනු ලැබූ සැමදෙනාම
දණ්ඩ මත සවි කළ සර්පයා දෙස
බැලුවොත් නොමැරී ජීවත් වනු ඇතැ”
යි දෙවියන් වහන්සේ පොරොන්දු වූ
සේක. මෝසෙස් පිත්තල සර්පයෙකු
සෑදුවේය. ඒ දෙස බැලූ
මිනිස්සු සුව වූවෝය.


ජේසුස් වහන්සේ,
මනුෂ්‍ය පුත්‍රයා, පිත්තල
සර්පයා එසවූ ලෙසම
එසවෙන්න ඕනෑ බව
නිකදේමුස්ට කී සේක.
ජේසුස් වහන්සේ පැවසුවේ
උන්වහන්සේ
පව්කරුවන් වෙනුවෙන්
මිය යන්නට නියමිත
කුරුසිය ගැනය.


“දෙවියන්
වහන්සේ ලෝකයාට
කොතරම් ප්‍රේම කළාද
කිවහොත් උන්වහන්සේගේ
එකම පුත්‍රයා දුන් සේක. එසේ
කළේ උන්වහන්සේ ගැන
අදහාගන්නා කවුරුන්
නමුත් විනාශ නොවී
සදාකල් ජීවනය ලබන
පිණිසයැ” යි ජේසුස්
වහන්සේ කී සේක.


මෙයින් අදහස් වන්නේ
ජේසුස් වහන්සේ කෙරෙහි
අදහගන්නා කවුරුන්
නමුත් දෙවියන්
වහන්සේගේ පවුලට
උපදින බවය.

සමහරවිට එදා රාත්‍රියේම නිකදේමුස්, ජේසුස් වහන්සේගේ ගෝලයෙකු නොවූවා විය හැකිය. නමුත් අවුරුදු කිහිපයකට පසුව නිකදේමුස්, කුරුසියේ ඇණ ගසා මරා දැමුනු දෙවියන් වහන්සේගේ පුත්‍රයාව භූමදාන කරන්නට උදව් කිරීමෙන් ඔහු උන්වහන්සේට ආදරය කළ බවත්, විශ්වාස කළ බවත් පෙන්නුවේය.



ඉන්පසු, ජේසුස් වහන්සේද උන්වහන්සේගේ ගෝලයෝද උතුරු දෙසට ගමන් කළහ. වෙනත් පළාත් වල මිනිසුන්ටද දේව රාජ්‍යය ගැන අසා දැනගන්නට අවශ්‍යය විය. ඔවුන්ටද දැන් දෙවියන් වහන්සේගේ පුත්‍රවූ නාසරෙත්හි ජේසුස් වහන්සේ අදහාගන්නට අවස්ථාව ඇත.



නායක පූජකවරු ජේසුස් වහන්සේ හමුවෙති

# දේව වචනයෙන් එක් කථාවක්

# බයිබලයේ

ශු. ජොහාන් 2-3, ගණන් කතාව 21

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)